## දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල - 2014

------------------------------------------------------------------

දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රමිත අංක 01 ක ප්‍රකාරව ආදායම් හා වියදම් අයිතම එකිනෙකට හිලව් නොකර වෙන වෙනම හෙළිදරව් කළ යුතුය. එසේ වුවද, 2014 දෙසැම්බර් 31 දිනට කල් පිරුණු ආයෝජන සඳහා රු. 3,973,154 ක් ද, කල් නොපිරුණු ආයෝජන සඳහා රු. 1,075,330 ක් ද වශයෙන් බැංකුව විසින් අඩුකළ සියයට 8 ක් වූ රඳවාගැනීමේ බදු එකතුව රු. 5,048,484 ක් වියදම් යටතේ වෙනම හෙළිදරව් නොකර බදු අයකළ පසු ශුද්ධ අගයයන් ආයෝජන පොළී ආදායම වශයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි උපදෙස්වලින් බැහැරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2014 දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් හා සමාන දෑවල වටිනාකම රු.26,575,357 ක් විය යුතු වුවත් එය රු.39,639,480 ක් වශයෙන් රු. 13,064,123ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) මුදලින් ලැබූ ආදායම් වෙනුවට උපචිත පදනමට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගැලපූ රු.177,497,070 ක ලොතරැයි දායක මුදල් ආදායම් හා රු.48,996,169 ක ආයෝජන පොලී ආදායම් මුදල් ගලා ඒම් වශයෙන් ද, ත්‍යාග මුදල් සඳහා වෙන්කිරීම් රු. 180,000,000 ක් හා පරිගණක ක්ෂය වෙන්කිරීම් රු. 208,897 ක් මුදල් ගලායාම් වශයෙන් ද මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයන් ලෙස දක්වා තිබුණි.

(iii) අරමුදලේ මූල්‍ය ක්‍රියාකාරීත්වය යටතේ මුදල් ප්‍රවාහයක් ජනිත නොවන නමුත් ත්‍යාග සඳහා වෙන්කිරීම් ණයහිමියෝ, පරිගණක ක්ෂය වෙන්කිරීම් හා සමුච්චිත අරමුදලට ගැලපීම්වල එකතුව රු. 180,173,197 ක මුදල් ගලා ඒමක් වශයෙන් දක්වා තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 (ආ) ඡේදය ප්‍රකාරව අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 45,622,092 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 33,440,323 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 12,181,769 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ආයෝජන පොලී ආදායම රු.3,015,090 කින් ඉහළයාම හා මුළු වියදම රු.9,239,509 කින් අඩුවීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ රෙගුලාසි මාලාවේ අංක 17 ප්‍රකාරව සෑම මාසයකම දත්ත සමුදාය යාවත්කාලීන කර දිනුම් ඇදීම සිදු කළයුතු නමුත් 2012, 2013 හා 2014 වර්ෂයන්හිදී එලෙස මාසිකව දිනුම් ඇදීම් සිදුකර නොතිබූ අතර 2012 හා 2013 වර්ෂ වෙනුවෙන් 2014 නොවැම්බර් මාසයේදීත් 2014 වර්ෂය වෙනුවෙන් 2016 ජනවාරි මාසයේදීත් දිනුම් ඇදීම සිදු කර තිබුණි. පරිගණක දත්ත පද්ධතිය යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් 2012 සිට 2014 දක්වා වූ කාල සීමාවේ ප්‍රතිලාභීන් නොවූ පවුල් 81ක් වෙත දිනුම් ඇදී තිබූ රු. 12,150,000 ක් ඇතුළුව විවිධ හේතූන් මත එම කාලසීමාවේ දිනුම් ලැබූ ප්‍රතිලාභීන් 191 දෙනෙකු වෙත දිනුම් ලැබූ රු. 28,650,000 ක මුදලක් ප්‍රදානය කිරීමට නොහැකි වී තිබුණි

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ අරමුදලේ මුදල් අවශ්‍යතාවය ඉක්මවා රු. 3,061,151 ක සිට රු. 36,356,373 ක් අතර පරාසයක මුදල් ශේෂයක් පවත්වා ගෙන තිබීම හේතුවෙන් එම මුදල් ආයෝජනයෙන් උපයාගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි. තවද, අරමුදල් අවශ්‍යතාවය හා පොළී ආදායම් ඉපැයීම යන අරමුණු දෙකම ඉටුවන ආකාරයට ආයෝජනය කළ යුතු කාල සීමාව තීරණය නොකර 2014 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.736,408,715 ක් වූ සියළුම ආයෝජන කල්පිරීමේ කාලය මාස 06 ක් බැගින් වූ කෙටිකාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය තිබුණි.

(ආ) අරමුදලේ කාර්යයන් සඳහා පූර්ණකාලීනව යොදවා ඇති කාර්යමණ්ඩලයේ වැටුප් හා අනෙකුත් පොදුකාර්ය වියදම් රජය මගින් දරනු ලැබුවද එම වියදම් රජය වෙත ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අරමුදලේ රෙගුලාසිමාලාව ප්‍රකාරව සියලු කාර්යයන් නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල් භාරකාර මණ්ඩලය විසින් සිදුකළ යුතු වුවත්, 2014 ජනවාරි සිට 2015 ඔක්තෝබර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ භාරකාර මණ්ඩලයක් පත් කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද,සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, වර්ෂ 4 ක කාලපමාවකින් පසුව 2019 පෙබරවාරි 07 දින ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර අරමුදල ව්‍යවස්ථාපිත කර අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම තුළින් පොත්පත් හා වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගැනීම හා විධිමත් පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.